021

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 7 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02යි.

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන හෝ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුලක ඇති විශේෂත්වය වන්නේ,

(1) මව සහ පියාගේ රැකවරණය ලැබීම

(2) දරුවන්ට දෙමාපියන්ගේ මෙන් ම සෙසු සාමාජිකයන්ගේ ද ආදරය, ආරක්ෂාව, පෝෂණය ලැබීම

(3) සාමාජිකයින් සංඛ්‍යාව අඩුවීම නිසා වියදම් අඩුවීම

(4) සාමාජිකයන් අතර සමීප සම්බන්ධතා නොපැවතීම

(02) ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) නීතිගරුක වීම, කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීම

(2) උත්සාහවන්ත වීම, සච්චු මිතුරන් ඇසුර

(3) දනුම වර්ධනය වීම, පරාජයේ දී ආවේගශීලී බව

(4) කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීම, නීතිගරුක නොවීම

(03) බුද්ධිමත් පාරිභෝගිකයෙකු භාණ්ඩ මිල දී ගැනීමේ දී සලකා බලන්නේ,

(1) අඩු මිලට ගුණාත්මයෙන් යුත් භාණ්ඩ මිලට ගැනීමට ය.

(2) වැඩි මිලට ගුණත්වයෙන් යුත් භාණ්ඩ මිලට ගැනීමට ය.

(3) ගුණත්වයෙන් අඩු භාණ්ඩ අඩු මිලට අවශ්‍යතාවය පරිදි මිලට ගැනීමට ය.

(4) සාධාරණ මිලට ගුණත්වයෙන් යුත් භාණ්ඩ තම අවශ්‍යතාවය පරිදි මිලට ගැනීමට ය.

(04) ඔබගේ මවගේ අයියාගේ බිරිද, ඔබට ඇති ඥාතීත්වය

(1) පුංචි අම්මා
(2) නැන්දා
(3) නෑනා
(4) ලොකු අම්මා

(05) ඔබේ ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියකින් ඉටු නොවන සේවාවක් වන්නේ,

(1) ප්‍රදේශයේ පොදු සේවා සැපයීමට දායක වීම

(2) ග්‍රාම සංවර්ධනයට දායක වීම

(3) ගමේ සුභ සාධක කටයුතු සඳහා මැදිහත් වීම

(4) පුද්ගලයින්ගේ අධ්‍යාත්මික සංවර්ධනයට දායක වීම

(06) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ ඇමතුම් අංකය වන්නේ,

(1) 1918 (2) 1991 (3) 1919 (4) 1999

(07) කර්මාන්ත හා කාර්යාල සේවක පනතට අනුව සේවය සඳහා යොදවා ගත නොහැක්කේ කුමන වයසේ දරුවන් ද?

(1) වයස අවු. 18ට අඩු ළමයින් (2) වයස අවු. 14ට අඩු ළමයින්

(3) වයස අවු. 12ට අඩු ළමයින් (4) වයස අවු. 17ට අඩු ළමයින්

(08) බහු සංස්කෘතික ජන සමාජයක් පවතින ලංකාවේ වෙසෙන ජනතාව විසින් පොදුවේ වන්දනාවට යන පූජනීය ස්ථානයකි.

(1) ශ්‍රී මහා බෝධිය (2) කතරගම දේවාලය

(3) දෙවුන්දර දේවාලය (4) දවටගහ පල්ලිය

(09) 1948 ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය නිර්මාණය කරන විට සිටි අග්‍රාමාත්‍යවරයා,

(1) සර් ජෝන් කොතලාවල මහතා (2) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

(3) ඩී. එස්. සේනානායක මහතා (4) ඩඩ්ලි සේනානායක මහතා

(10) පුද්ගලයෙකුට හිමි දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,

(1) කැමති ආගමක් ඇදහීම (2) කැමති ආණ්ඩුවක් පත්කර ගැනීම

(3) ජීවත්වීමේ අයිතිය (4) කැමති තැනක ජීවත් වීම

- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(11) භාණ්ඩ වල පිල්ලර මිල දක්වෙන පාරිභෝගික මිල දර්ශනයක් වෙළඳසැල්වල ප්‍රදර්ශනය කර තැබීම අත්‍යවශ්‍ය ය. ( )

(12) පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම සඳහා භාවිතා කරන්නේ DNA පරීක්ෂණයයි. ( )

(13) කාලගුණික අනාවැකි වැදගත් වන්නේ ධීවරයින්ට පමණි. ( )

(14) අපේ රටේ ජාතික ගීයේ නිර්මාතෘවරයා මහගමසේකර මහතා ය. ( )

(15) ජාතික කොඩියේ තැඹිලි සහ කොළ පාට තීරුවලින් දෙමළ සහ මුස්ලිම් ජනවර්ග නියෝජනය කෙරේ. ( )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(16) ජන සමාජයේ යහපත සඳහා .................................................. යුතුකම් ඉටුකිරීම සෑම පුරවැසියකුගේම යුතුකමකි.

(17) යහපත් පුරවැසියෙකු ලෙස ජීවත්වීම සඳහා .................................................. ගුණ සංවර්ධනය කළ යුතුවේ.

(18) පාසල් සිසුවෙකු ලෙසින් අයිතිවාසිකම් භුක්ති විඳිමින් ...................................................... ඉටු කරමු.

(19) බහු සංස්කෘතික සමාජයක ...................................................... සහ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

(20) ජීවිත අභියෝග ජය ගැනීමට නම් ...................................................... ගොඩනගා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

(නීතිමය , ඉවසීම , යුතුකම් , සාමකාමීව , අරමුණ , වගකීම්)

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(01) "ජන සමාජයේ කුඩා ම ඒකකය පවුලයි."

(1) ඔබේ සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග තුනක් නම් කරන්න.

(2) පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන හතරක් නම් කරන්න.

(3) පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

(02) "චිත්තවේග යහපත් ලෙස හසුරුවා ගනිමු."

(1) පුද්ගලයෙකු තුළ ඇතිවන විවිධාකාර චිත්තවේග තත්ත්වයන් තුනක් සඳහන් කරන්න.

(2) අයහපත් චිත්තවේග පාලනය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් සඳහන් කරන්න.

(3) යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම සඳහා පුගුණ කළ යුතු ගුණාංග පහක් සඳහන් කරන්න.

(03) "බුද්ධිමත් පාරිභෝගිකයෙකු වීමෙන් සෞඛ්‍යය ද ආරක්ෂා වේ."

(1) බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස භාණ්ඩයක් මිලට ගැනීමේ දී සලකා බලන කරුණු තුනක් සඳහන් කරන්න.

(2) ඔබ නිවසට ගෙනෙන භාණ්ඩවල ඇසුරුමක සඳහන් වන කරුණු හතරක් සඳහන් කරන්න.

(3) නව පාසල් උපකරණයක් වෙළඳ පොළට හඳුන්වා දීමේ දී ඒ පිළිබඳව ඔබට දැන ගත හැකි ක්‍රම හතරක් ලියන්න.

(04) "නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමු."

(1) ජන සමාජයේ වෙසෙන පුද්ගලයෙකුට හිමි දේශපාලන අයිතිවාසිකම් තුනක් සඳහන් කරන්න.

(2) පුද්ගලයෙකුට හිමි සිවිල් අයිතිවාසිකම් හතරක් සඳහන් කරන්න.

(3) ඔබට ලැබී ඇති අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

(05)යහපත් අන්තර් සම්බන්ධතා පැවැත්වීම ජන සමාජයේ යහපැවැත්මට හේතුවේ.''

(1) ජන සමාජයේ පවතින සමිති තුනක් නම් කරන්න.

(2) ගුරුවරුන් හා සිසුන් අතර මනා අන්තර් සම්බන්ධතා පැවැත්වීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

(3) ඔබගේ පවුලේ සමාජිකයින් අන්තර් සබඳතා පවත්වන ආයතන දෙකක් සඳහන් කර ඉන් ඔබට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(06)''ශ්‍රී ලාංකික ජන සමාජයේ සංස්කෘතික විවිධත්වයක් ඇත.''

(1) පැම සංස්කෘතියක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

(2) ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග හතරක් නම් කර ඔවුන් අදහන ආගම් සඳහන් කරන්න.

(3) එවැනි ජනවර්ග දෙකක් සමරනු ලබන උත්සව පහක් ලියන්න.

(07)''ශ්‍රී ලාංකික හැඟීමෙන් කටයුතු කිරීම ජාතික අනන්‍යතාව වේ.''

(1) ශ්‍රී ලාංකිකයන් ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා තුනක් ලියන්න.

(2) අපේ රටේ ජාතික කොඩියේ දකිය හැකි සංකේත හතරක් නම් කරන්න.

(3) ජාතික කොඩිය මසවනු ලබන අවස්ථා තුනක් සඳහන් කර ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථාවක් සඳහන් කරන්න.